රහස්‍යය යි

සංශෝධනයන්ට යටත්ය

2561 - බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2016 (2017)

ලකුණු දීමේ පටිපාටිය



(05) බෞද්ධ සමාජ දර්ශනය

ඇගයීම් (ආයතනික විභාග) ශාඛාව

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

පැලවත්ත

බත්තරමුල්ල.

Past Papers Wiki

2561 - බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2016 (2017)

S 5

(05) බෞද්ධ සමාජ දර්ශනය

ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

II කොටස

2. (i) සිගාලෝවාද සූත්‍රයේ දැක්වෙන, දෙමාපියන් විසින් දරුවන්ට ඉටු කළයුතු යුතුකම් පහ නම් කරන්න. (ලකුණු 04 යි)

(ii) 'බෞද්ධ සමාජයේ දූ දරුවන් විසින් තම දෙමාපියන්ට යුතුකම් ඉටු කරන නිසා දෙමාපියෝ සුඛිත මුදිත වෙති.' යන ප්‍රකාශය තහවුරු කරන්න. (ලකුණු 07 යි)

(iii) 'පවුලට ද සමාජයට ද රජයට ද තම වගකීම් ඉටු කරන පුද්ගලයා සමාජ අභිවෘද්ධියට දායක වේ.' යන ප්‍රකාශය සිගාලෝවාද සූත්‍රය ඇසුරෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 07 යි)

3. (i) ලෝකයේ ආරම්භය හා ජනාවාස වූ ආකාරය පිළිබඳ පුවත අග්ගඤ්ඤ සූත්‍රයේ දැක්වෙන අයුරින් කෙටියෙන් සටහන් කරන්න. (ලකුණු 04 යි)

(ii) අපරාධ මර්දනයට ජන සම්මතයෙන් රජෙකු පත් කර ගැනීමේ පුවත අග්ගඤ්ඤ සූත්‍රය ඇසුරෙන් කෙටියෙන් පෙන්වා දෙන්න. (ලකුණු 07 යි)

(iii) 'තෘෂ්ණාව, අනුකරණය හා අලසකම සමාජ පරිණාමයට පාදක වූ ආකාරය අග්ගඤ්ඤ සූත්‍රයේ දැක්වේ' යන කියමන සනාථ කරන්න. (ලකුණු 07 යි)

4. (i) නිබ්බේධික සූත්‍රයේ දැක්වෙන පංචගතිය නම් කරන්න. (ලකුණු 04 යි)

(ii) එම පංචගතිය අතරින් මනුෂ්‍ය ගතියට අදාළ පුද්ගල වෛමත්තතාව කෙරෙහි කර්මයේ බලපෑම පෙන්වා දෙන්න. (ලකුණු 07 යි)

(iii) 'පරිසරය පිළිබඳ බෞද්ධ දාර්ශනික චින්තනයේ පදනම පටිච්චසමුප්පාදයයි' යන්න තහවුරු කරන්න. (ලකුණු 07 යි)

5. (i) බ්‍රාහ්මණ සමාජයේ චතුර්වර්ණයට පැවරුණු කාර්ය නියමයන් නම් කරන්න. (ලකුණු 04 යි)

(ii) 'ජන්මය ලැබූ සමාජ ස්තරයේ ම පුද්ගලයා රඳවන බ්‍රාහ්මණ ඉගැන්වීම් සමාජ සචලතාවට බාධකයක් විය.' යන කරුණ පැහැදිලි කරන්න. (ලකුණු 07 යි)

(iii) 'බලවත් පීඩාවක් හා අනර්ථයක්ව පැවති සමාජ සංස්ථාවක් වෙනස් කිරීමට බුදුරදුන් දැරූ ප්‍රයත්නය මානව වර්ගයාගේ ප්‍රණාමයට ලක් විය යුතුයි.' යන ප්‍රකාශය විචාරයට ලක්කරන්න. (ලකුණු 07 යි)

6. (i) එක්වන අඹුසැමි යුවලේ ස්වභාවය අනුව විවාහක යුගල හතරක් බුදුදහමේ දැක්වේ. එම යුගල හතර නම් කරන්න. (ලකුණු 04 යි)

(ii) භාර්යාවන් හත් දෙනා නම් කර යෝග්‍ය, අයෝග්‍ය යන කාණ්ඩ දෙකට වෙන් කර දක්වන්න. (ලකුණු 07 යි)

(iii) 'විවාහය යනු යුවලක් එක් වී කරන සදාචාර ප්‍රතිපත්ති පූරණයකි.' යන්න පැහැදිලි කරන්න. (ලකුණු 07 යි)

7. (i) යුද්ධයට පසුබිම් වන මූලික චේතනා තුනක් නම් කරන්න. (ලකුණු 04 යි)

(ii) 'ජයං වෙරං පසවති' යන ගාථාව සම්පූර්ණ කර ලියන්න (ලකුණු 07 යි)

(iii) 'යුද්ධයෙන් තොර සමාජයක් සඳහා බුදුදහමේ ඉගැන්වීම් පදනම්කොට ගෙන සැකසිය හැකි ප්‍රායෝගික වැඩපිළිවෙළක්' ඉදිරිපත් කරන්න. (ලකුණු 07 යි)

8. (i) කර්කයෙන් හෝ විද්‍යාවෙන් හසුකර ගත නොහැකි දෙයක් ලෙස බුදුදහමෙහි දැක්වෙන්නේ කුමක් ද? (ලකුණු 04 යි)

(ii) විද්‍යාව සමග බුදුසමය බෙහෙවින් සමීප වන මූලික කරුණු හතරක් දක්වන්න. (ලකුණු 07 යි)

(iii) 'විද්‍යාඥයාට ගැළපෙන ආගම ලෙස විවිධ ආගම් අතරින් උපුටා දැක්විය හැක්කේ බුදුදහමයි' යන්නට පක්ෂව හෝ විපක්ෂව හෝ කරුණු දක්වන්න. (ලකුණු 07 යි)

* * *

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

2561 - බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2016 (2017)

(05) බෞද්ධ සමාජ දර්ශනය

සවිස්තර ලකුණු දීමේ පටිපාටිය

1 ප්‍රශ්නය -	(i) සිට (x) තෙක් කොටස්වලට 2+2+3+3+3+3+3+3+3+3 ලකුණු 24	24
2 ප්‍රශ්නයේ සිට 9 වැනි ප්‍රශ්නය තෙක් ප්‍රශ්න හතරකට ලකුණු 18 බැගින් 18x4 ලකුණු	72	72
	මුළු ලකුණු	100

ආදර්ශ පිළිතුරු

1 කොටස

1. ප්‍රශ්නය

(i) අ) තෘෂ්ණාවෙන් මෙහෙයවනු ලබන මෝඩ මිනිසුන් අතර නොමරමින්, නොමරවමින්, නොදිනමින්, නොදිනවමින්, ශෝක නොකරමින් දැහැමින් රාජ්‍යයක් කළ හැකිදැයි මෙනෙහි කොට බුදු රදුන් මාරයාට නිග්‍රහ කළ බව දැක්වෙන්නේ කිනම් සූත්‍රයේ ද?

පිළිතුර

රත්ථි සූත්‍රයේ,

උපදෙස්

ඉහත පිළිතුර ඇත්නම් එක (1) ලකුණක් ප්‍රදානය කරන්න.

(ආ) අනාගතයේ පහළ වන සක්විති රජෙකු මෛත්‍රේය බුදුරදුන් වෙත පැවිදි වන බව දැක්වෙන සූත්‍රයත් එම සක්විති රජුගේ නමත් ලියා දක්වන්න. (ලකුණු 02යි.)

පිළිතුර

චක්කවත්ති සීහනාද සූත්‍රය,

සංඛ සක්විති රජ,

PAST PAPERS WIKI

උපදෙස්

කරුණු දෙකම දක්වා තිබේ නම් ලකුණු (1) එකක් ප්‍රදානය කරන්න. එකක් පමණක් දැක්වේ නම් ලකුණු ප්‍රදානය කළ නොහැකිය.

නිවැරදි පිළිතුරට (අ) කොටසට ලකුණු 01ක් ද (ආ) කොටසට ලකුණු 01ක් ද වශයෙන් ප්‍රදානය කළ හැකි මුළු ලකුණු ගණන 02කි.

(ii) (අ) අන්‍යයන්ගේ ආගමට නිග්‍රහ කරන්නා තම ආගමට නිග්‍රහ කරයි' යන ප්‍රකාශය සෙල්ලිපිවල සටහන් කරවූයේ කිනම් රජෙකු විසින් ද?

පිළිතුර

(i) *ධර්මාශෝක මහරජතුමා විසින්,*

උපදෙස්

ඉහත පිළිතුර දක්වා තිබේ නම් ලකුණු 01ක් ප්‍රදානය කරන්න.

(ආ) දළදා මාළිගාව පිහිටි මහනුවර ම රැකවරණ සපයා පල්ලියක් ඉදිකරගැනීමට රෝමානු කතෝලික ක්‍රිස්තු භක්තිකයන්ට ඉඩකඩ සැපයීමෙන් පෙනෙන්නේ බෞද්ධයන් අන්‍ය ආගම් පිළිබඳව අනුගමනය කළ කවර ප්‍රතිපත්තියක් ද? (ලකුණු 02යි)

පිළිතුර

(i) *අන්‍ය ආගම් පිළිබඳ සහනශීලී ප්‍රතිපත්තිය.*

උපදෙස්

ඉහත පිළිතුර දක්වා තිබේ නම් ලකුණු 01ක් ප්‍රදානය කරන්න.

නිවැරදි පිළිතුරට (අ) කොටසට ලකුණු 01ක් ද (ආ) කොටසට ලකුණු 01ක් ද වශයෙන් ප්‍රදානය කළ හැකි මුළු ලකුණු ගණන 02කි.

(iii) (අ) සක්විති රජුගේ සප්ත රත්නය නම් කරන්න.

පිළිතුර

චක්‍රරත්නය,
හස්තිරත්නය,
අශ්වරත්නය,
මාණිකයරත්නය,
ස්ත්‍රීරත්නය,
ගෘහපති රත්නය හා
පරිනායකරත්නයයි.

උපදෙස්

ඉහත රත්න සතෙන් තුනක් වත් දක්වා තිබේ නම් ලකුණු 02 ක් ප්‍රදානය කරන්න.

(ආ) ගෘහස්ත ජීවිතයේ අග්‍රඵලයක් ප්‍රව්‍රජිත ජීවිතයේ අග්‍රඵලයත් ලෙස සැලකෙන්නේ කවර පදවිදැයි ලියා දක්වන්න. (ලකුණු 03යි)

පිළිතුර

ගෘහස්ත ජීවිතයේ අග්‍රඵලය - සක්විති රජ පදවිය වේ.
ප්‍රව්‍රජිත ජීවිතයේ අග්‍රඵලය - බුදුබුදු පදවිය වේ.

උපදෙස්

ඉහත සඳහන් පදවි දෙක ම දක්වා තිබේ නම් ලකුණු 01 ක් ප්‍රදානය කරන්න.

නිවැරදි පිළිතුරට (අ) කොටසට ලකුණු 02ක් ද (ආ) කොටසට ලකුණු 01ක් ද වශයෙන් ප්‍රදානය කළ හැකි මුළු ලකුණු ගණන 03කි.

(iv) (අ) මූලික මානව අයිතිවාසිකම් පහක් රැකීමට ගිහි බෞද්ධයා කරුණු පහකින් වැළකී සිටියි, එම කරුණු පහ පෙන්වා දෙන්න.

පිළිතුර

ප්‍රාණඝාතයෙන් වැළකීම,
සොරකමෙන් වැළකීම,
කාමමිථ්‍යාචාරයෙන් වැළකීම,
බොරුකීමෙන් වැළකීම හා
මත්පැනින් වැළකීම.

උපදෙස්

ඉහත කරුණු පහ ම පාලියෙන් හෝ සිංහලෙන් දක්වා තිබේ නම් ලකුණු 01ක් ප්‍රදානය කරන්න.

(ආ) මූලික මිනිස් අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශය කවර සංවිධානයකින් කවර දිනක ප්‍රකාශයට පත් කරන ලද්දක් ද? (ලකුණු 03යි)

පිළිතුර

එක්සත් ජාතීන්ගේ සංවිධානය ,
1948 . දෙසැම්බර් . 10 දින,

උපදෙස්

ඉහත දක්වුණු පිළිතුර දක්වා තිබේ නම් ලකුණු 02ක් ද ප්‍රදානය කරන්න.

නිවැරදි පිළිතුරට (ආ) කොටසට ලකුණු 01ක් ද (ආ) කොටසට ලකුණු 02ක් ද වශයෙන් ප්‍රදානය කළ හැකි මුළු ලකුණු ගණන 03කි.

(v) (අ) බෞද්ධ සමාජයේ සිවු පිරිස නම්කරන්න.

පිළිතුර

(i) *භික්ෂු*
(ii) *භික්ෂුණී*
(iii) *උපාසක*
(iv) *උපාසිකා*

උපදෙස්

ඉහත දක්වුණු පිළිතුර දක්වා තිබේ නම් ලකුණු 01ක් ප්‍රදානය කරන්න.

(ආ) මහාබ්‍රහ්මයා චතුර්වර්ණයට අනුව මනුෂ්‍යයා නිර්මාණය කළ බව සඳහන් වන ඍග්වේදයේ පුරුෂ සූක්තයේ ඇතුළත් 'බ්‍රාහ්මණොඝ්‍ය මුඛමාසීතත් ' යන ශ්ලෝකය සම්පූර්ණ කර ලියන්න. (ලකුණු 03යි)

පිළිතුර

බ්‍රාහ්මණොඝ්‍ය මුඛමාසීද්
බාහුරාජන්‍යඃ කෘතඃ
ඌරූ තදඝ්‍ය යද් වෛශ්‍යං
පද්භ්‍යාං ශූද්‍රෝ අජායත,

Past Papers Wiki

උපදෙස්

ඉහත දක්වුණු ශ්ලෝකය දක්වා තිබේ නම් ලකුණු 02ක් ප්‍රදානය කරන්න.

නිවැරදි පිළිතුරට (ඇ) කොටසට ලකුණු 01ක් ද (ආ) කොටසට ලකුණු 02ක් ද වශයෙන් ප්‍රදානය කළ හැකි මුළු ලකුණු ගණන 03කි.

(vi) (අ) රාජ්‍යයක් අභිවෘද්ධියට හේතුවන කරුණු හතක් මහා පරිනිබ්බාණ සූත්‍රයේ දැක්වේ. එම කරුණු අතරින් දෙකක් සඳහන් කරන්න.

පිළිතුර

(i) *නිතර රැස්වීම,*

(ii) *සමගියෙන් රැස්ව කටයුතු කොට සමගියෙන් විසිර යෑම,*

(iii) *නොපැණවූ දේ නොපණවා පැණවූ දේ පිළිපැදීම,*

(iv) *වැඩිහිටියන්ගේ අදහස්වලට ගරු කිරීම,*

(v) *ස්ත්‍රීන්ට අයුතු බලපෑම් නොකිරීම,*

(vi) *පුරාණ සිද්ධස්ථාන රැකගැනීම,*

(vii) *ආගන්තුකව පැමිණෙන ආගමික උතුමන් වෙත රැකවරණ හා පහසුකම් සැපයීම,*

උපදෙස්

කරුණු එකක් නම්කිරීමට එක් ලකුණ බැගින් කරුණු දෙකක් නම්කිරීමට ලකුණු 02ක් ප්‍රදානය කරන්න.

(ආ) 'අපි ඔහුට අපේ හාල් අස්වැන්නෙන් කොටසක් දෙමු' යැයි කතිකා කර ගැනීමෙන් රාජ්‍ය බදු ක්‍රමය ආරම්භ වූ ආකාරය සටහන්ව තිබෙන්නේ කිනම් සූත්‍රයක ද?. (ලකුණු 03යි)

පිළිතුර

දීඝ නිකායේ අග්ගඤ්ඤ සූත්‍රයේ.

උපදෙස්

ඉහත පිළිතුර දක්වා තිබේ නම් ලකුණු 01ක් ප්‍රදානය කරන්න. (අග්ගඤ්ඤ සූත්‍රයේ යැයි පමණක් සඳහන් කර තිබීම වුව ද ප්‍රමාණවත්ය,)

නිවැරදි පිළිතුරට (අ) කොටසට ලකුණු 02ක් ද (ආ) කොටසට ලකුණු 01ක් ද වශයෙන් ප්‍රදානය කළ හැකි මුළු ලකුණු ගණන 03කි.

(vii) (අ) 'යෙ ගහට්ඨා පුඤ්ඤකරා' යන ගාථාව සම්පූර්ණ කර ලියන්න,

පිළිතුර

යෙ ගහට්ඨා පුඤ්ඤකරා
සීලවන්තා උපාසකා
ධම්මෙන දාරං පොසෙන්ති
නං (නෙ) නමස්සාමි මාතලී.

උපදෙස්

ඉහත පිළිතුර දක්වා තිබේ නම් ලකුණු 01ක් ප්‍රදානය කරන්න.

(ආ)ස්වාමි පුරුෂයා තම භාර්යාවට ඉටු කළ යුතු යුතුකම් පහක් සිගාලෝවාද සූත්‍රයේ දක්වා ඇත, ඉන් යුතුකම් දෙකක් නම්කරන්න (ලකුණු 03යි)

පිළිතුර

ගෞරවාන්විතව ක්‍රියා කිරීමෙන්,

අගෞරව නොකිරීමෙන්,

දුසිරිතෙහි නොයෙදීමෙන්,

ඉෂ්‍යුරු පවරාදීමෙන්,

ආභරණ ආදිය ගෙනදීමෙන්,

උපදෙස්

ඉහත දැක්වුණු කරුණු දෙකක් දක්වා තිබේ නම් ලකුණු 02ක් ප්‍රදානය කරන්න.

නිවැරදි පිළිතුරට (අ) කොටසට ලකුණු 01ක් ද (ආ) කොටසට ලකුණු 02ක් ද වශයෙන් ප්‍රදානය කළ හැකි මුළු ලකුණු ගණන 03කි.

(viii) (අ) වැළකිය යුතු වැරදි වෙළෙඳාම් පහක් ධර්මයේ දැක්වේ. ඉන් වෙළෙඳාම් දෙකක් පෙන්වා දෙන්න.

පිළිතුර

සතුන් හා මිනිසුන් වෙළෙඳාම (සත්තවණිජ්ජා)

අවිආයුධ වෙළෙඳාම (සත්ථ වණිජ්ජා)

විෂ වෙළෙඳාම (විෂ වණිජ්ජා)

මස් වෙළෙඳාම (මාංස වණිජ්ජා)

මත් ද්‍රව්‍ය වෙළෙඳාම (මජ්ජ වණිජ්ජා)

උපදෙස්

ඉහත දැක්වූ වෙළෙඳාම් දෙකක් දක්වා තිබේ නම් ලකුණු 01ක් ප්‍රදානය කරන්න.

(ආ) වැරදි කිරුම් මිනුම්වලින් වැළකෙන ලෙස බුදුදහම උපදෙස් දෙයි, එම කිරුම් මිනුම් ලියා දක්වන්න. (ලකුණු 03යි)

පිළිතුර

තුලාකූට (තරාදි ඌනකරණ භාවිතයෙන් වැරදි ලෙස වංචා කිරීම)

කංසකූට (ද්‍රව්‍ය බාල කර විකිණීම හෝ බාල ද්‍රව්‍ය උසස් කර විකිණීම)

මානකූට (මැනීමේ දී කරන වංචනික ක්‍රියා)

උපදෙස්

ඉහත කරුණු කුප ම ලියා තිබේ නම් ලකුණු 02ක් ප්‍රදානය කරන්න

නිවැරදි පිළිතුරට (අ) කොටසට ලකුණු 01ක් ද (ආ) කොටසට ලකුණු 02ක් ද වශයෙන් ප්‍රදානය කළ හැකි මුළු ලකුණු ගණන 03කි.

(ix) (අ) නාස්තියට හා අපරිභෝජනයට නිදර්ශන කොට දැක්විය හැකි පුද්ගලයන් දෙදෙනා සඳහන් කරන්න.

පිළිතුර

නාස්තිය, - උදුම්බරබාදික

අපරිහරණය - අප්පටිසංඛාරික

උපදෙස්

ඉහත පිළිතුර සපයා තිබේ නම් ලකුණු 01ක් ප්‍රදානය කරන්න.

(ආ) අධිපරිභෝජනයට නිදර්ශනය වන පුද්ගලයන් පහක් බුදුහු දක්වති. ඉන් එක් අයෙකු නම්කරන්න. (ලකුණු 03යි)

පිළිතුර

ආහර හත්ථක

අලං සාටක

තන්තුවට්ටක

කාකමාසක

භුත්තවමිනක.

උපදෙස්

ඉහත පිළිතුරේ දක්වා තිබෙන කරුණු එකක් දක්වා තිබේ නම් ලකුණු 02ක් ප්‍රදානය කරන්න.

නිවැරදි පිළිතුරට (අ) කොටසට ලකුණු 01ක් ද (ආ) කොටයට ලකුණු 02ක් ද විෂයෙන් ප්‍රදානය කළ හැකි මුළු ලකුණු ගණන 03කි.

(x) (අ) 'න ජච්චා වසලෝ හොති' යන ගාථාව සම්පූර්ණ කර ලියන්න.

පිළිතුර

න ජච්චා වසලෝ හොති

න ජච්චා හොති බ්‍රාහ්මණෝ

කම්මනා වසලෝ හොති

කම්මනා හොති බ්‍රාහ්මණෝ

උපදෙස්

සම්පූර්ණ ගාථාව ලියා තිබේ නම් අක්ෂරවින්‍යාසය සැලකිල්ලට නොගෙන ලකුණු 01ක් ප්‍රදානය කරන්න.

(ආ) 'තපෙන බ්‍රහ්මචරියෙන ' යන ගාථාව සම්පූර්ණ කර ලියන්න. (ලකුණු 03යි)

පිළිතුර

තපෙන බ්‍රහ්මචරියෙන

සංයමෙන දමෙන ච

එතෙන බ්‍රාහ්මණෝ හොති

එතං බ්‍රාහ්මණමුත්තමං

උපදෙස්

මේ ගාථාව දක්වා තිබේ නම් ලකුණු 02ක් ප්‍රදානය කරන්න.

නිවැරදි පිළිතුරට (අ) කොටසට ලකුණු 01ක් ද (ආ) කොටසට ලකුණු 02ක් ද වශයෙන් ප්‍රදානය කළ හැකි මුළු ලකුණු ගණන 03කි.

11කොටස

2.ප්‍රශ්නය

(i) සිඟාලෝවාදසූත්‍රයේ දැක්වෙන, දෙමාපියන් විසින් දරුවන්ට ඉටු කළ යුතු යුතුකම් පහ නම්කරන්න. (ලකුණු 04යි)

පිළිතුර

පවින් වැළැක්වීම

යහපතෙහි පිහිටුවීම

ශිල්ප ඉගැන්වීම

යෝග්‍ය වයසේ දී අවාහ විවාහ කරදීම

සුදුසු කල දායාද පවරා දීම

උපදෙස්

කරුණු පහ ම හෝ හතරක් ලියා ඇත්නම් ලකුණු 04 ම ප්‍රදානය කිරීම මැනවි. එසේ නොමැති විට එක් කරුණකට එක් ලකුණු බැගින් ප්‍රදානය කරන්න.

(ii) බෞද්ධ සමාජයේ දූ දරුවන් විසින් තම දෙමාපියන්ට යුතුකම් ඉටුකරන නිසා දෙමාපියෝ සුඛිත මුදිත වෙති,' යන ප්‍රකාශය තහවුරු කරන්න. (ලකුණු 07යි)

පිළිතුර

සිගාලෝවාදසූත්‍රයේ දරුවන් විසින් දෙමාපියන්ට ඉටුකළ යුතු යුතුකම් වන 'මාපියන් පෝෂණය කළ යුතුය, ඔවුන්ගේ විවිධ කටයුතු කරදිය යුතුය, පරම්පරාව රැකගත යුතුය, උරුම වූ දේපල ආදිය රැකගත යුතුය මිය ගිය පසු පින් දිය යුතුය' යන කරුණු ද ඇතුළත් කරමින් සැපයෙන නිදහස් පිළිතුරක් අපේක්ෂා කෙරේ.

උපදෙස්

ප්‍රමාණවත් පිළිතුරක් සපයා තිබේ නම් ලකුණු 07ක් ප්‍රදානය කළ මැනවි. අන්තර්ගත කරුණු සැලකිල්ලට ගෙන ලකුණු ප්‍රමාණය තීරණය කොට සුදුසු ලකුණක් ප්‍රදානය කළ මැනිවි.

(iii) 'පවුලට ද සමාජයට ද රජයට ද තම වගකීම ඉටුකරන පුද්ගලයා සමාජ අභිවෘද්ධියට දායක වේ' යන ප්‍රකාශය සිගාලෝවාදසූත්‍රය ඇසුරෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 07යි)

පිළිතුර

සිගාලෝවාදසූත්‍රයේ දැක්වෙන අයුරින් පුද්ගලයා වෙත පැවරෙන යුතුකම් හා අයිතිවාසිකම් මැනවින් ඉටුවන විට පවුලන් සමාජයන් රාජ්‍යයන් අභිවෘද්ධියට පත්වන අන්දම ප්‍රකට කෙරෙන නිදහස් පිළිතුරක් අපේක්ෂා කෙරේ.

උපදෙස්

සිගාලෝවාදසූත්‍රයේ දැක්වෙන කරුණු විස්තර කරමින් ප්‍රශ්නයට එල්ලවන ලෙස සපයන ප්‍රමාණවත් පිළිතුරකට ලකුණු 07ක උපරිමයට යටත් ව සුදුසු ලකුණක් ප්‍රදානය කරන්න.

3. ප්‍රශ්නය

(i) ලෝකයේ ආරම්භය හා ජනාවාස වූ ආකාරය පිළිබඳ පුවත් අග්ගඤ්ඤසූත්‍රයේ දැක්වෙන අයුරින් කෙටියෙන් සඳහන් කරන්න. (ලකුණු 04යි)

පිළිතුර

අග්ගඤ්ඤසූත්‍රයේ චූලනිකා මජ්ඣිමකා මහා ලෝකධාතු අතර චූළනිකා ලෝකධාතුවේ සංවට්ටමාන විවට්ටමාන අවස්ථා අතුරින් පෘථිවිය විවට්ටමාන අවධියට පත්වූ පස පෘථිවියට එන සත්ත්වයන්ගෙන් ලෝකය ජනාවාස වූ ආකාරය කෙටියෙන් දක්වා තිබීම ප්‍රමාණවත්ය.(බෞද්ධසමාජදර්ශනය පාඨ ග්‍රන්ථයේ 20වැනි පිටුවේ අවසාන ඡේදය බලන්න).

උපදෙස්

ඉහත දැක්වෙන ආකාරයේ කෙටි පිළිතුරකට ලකුණු 04ක් ප්‍රදානය කරන්න.

(ii) අපරාධමර්දනයට රජෙකු පත්කරගැනීමේ පුවත අග්ගඤ්ඤසූත්‍රය ඇසුරෙන් කෙටියෙන් පෙන්වා දෙන්න, (ලකුණු 07යි)

පිළිතුර

සන්නිධිකාර පරිභෝජනයෙන් පසු තෘෂ්ණාධිකව කුඹුරු වෙන් කරගැනීමෙන් පසුව සොරකම ඇතිවූ විට එම අපරාධ හා ඒ අනුව ඇතිවන අපරාධ මැඩීමට රජෙකු පත් කර ගැනීමේ පුවත් අග්ගඤ්ඤසූත්‍රයේ දැක්වෙන අයුරින් පෙන්වා දෙන පිළිතුරක් අපේක්ෂා කෙරේ. (බෞද්ධසමාජදර්ශනය පාඨග්‍රන්ථයේ 22වැනි පිටුවේ 2,3,4, ඡේද බලන්න)

උපදෙස්

ඉහත කරුණු දැක්වෙන පිළිතුරකට ලකුණු 07ක උපරිමයට යටත්ව සුදුසු ලකුණක් ප්‍රදානය කරන්න.

(iii) 'තෘෂ්ණාව, අනුකරණය හා අලසකම සමාජ පරිණාමයට පාදක වූ ආකාරය අග්ගඤ්ඤසූත්‍රයේ දැක්වේ' යන කියමන සනාථ කරන්න. (ලකුණු 07යි)

පිළිතුර

තෘෂ්ණාව, අනුකරණය හා අලසකම සොරකම ආදිය ආරම්භ වී සමාජය දූෂණය වීමටත් එම දූෂණ මැඩීමට රාජ්‍යත්වය ආදි පාලන ව්‍යුහයක් ඇතිවීමටත් පරිසරය විනාසමුඛයට පත්වීමටත් එම කරුණු ම සමාජ පරිහාණියටත් විවිධාකාරයෙන් හේතුවූ බව තහවුරු කරන පිළිතුරක් අපේක්ෂා කෙරේ. විවාහ සංස්ථා, පරිපාල ව්‍යුහ ආදි සමාජ සංස්ථාවල ප්‍රභවයට ද මේ කරුණු හේතු වූ ආකාරය දැක්විය හැකිය. (බෞද්ධසමාජදර්ශනය පාඨ ග්‍රන්ථයේ 23 පිටුව බලන්න)

උපදෙස්

අදාළ කරුණු ප්‍රමාණවත් ලෙස ඉදිරිපත් කර තිබෙන පිළිතුරකට ලකුණු 07ක උපරිමයට යටත් ව සුදුසු ලකුණු ප්‍රදානය කළ හැකිය.

4 ප්‍රශ්නය

(i) නිබ්බෙදික සූත්‍රයේ දැක්වෙන පංචගතිය නම්කරන්න. (ලකුණු 04යි.)

පිළිතුර

නිරය

තිරිසන් යෝනිය

ප්‍රේතවිෂය

මනුෂ්‍ය

දේව.

උපදෙස්

නිවැරදි පිළිතුරට ලකුණු 04ක් ප්‍රදානය කරන්න.

(ii) එම පංචගතිය අතුරින් මනුෂ්‍ය ගතියට අදාළ පුද්ගල චේමත්තාව කෙරෙහි කර්මයේ බලපෑම පෙන්වා දෙන්න. (ලකුණු 07යි)

පිළිතුර

කර්මය පුද්ගලචේමන්තනාවට බලපාන අන්දම පැහැදිලි කෙරෙන පිළිතුරක් අපේක්ෂා කෙරේ.

උපදෙස්

ප්‍රමාණවත් පිළිතුරකට ලකුණු 07ක උපරිමයට යටත්ව සුදුසු ලකුණු ප්‍රදානය කරන්න.

(iii) පරිසරය පිළිබඳ බෞද්ධ දාර්ශනික චින්තනයේ පදනම පටිච්චසමුප්පාදයයි' යන්න තහවුරු කරන්න. (ලකුණු 07යි)

පිළිතුර

බෞද්ධසමාජදර්ශනය පාඨ ග්‍රන්ථයේ 25 සිට 30 පිටු බලන්න. පරිසරයට අයත් පිටි අපිටි පද්ධති පටිච්චසමුප්පන්නව පවත්නා බව පැහැදිලි කරන පිළිතුරක් අපේක්ෂා කෙරේ. භෞතික පරිසරය එම පරිසරයේ සත්ව හා ශාඛ පිවිත කෙරේ බලපායි. මේ ශාඛසත්ව පිවිතවල චින්තන රටා පරිසරය කෙරෙහි බලපායි, ඒවා සදාචාරය කෙරෙහි බලපායි. එම ස්වභාවයන් පරිසරය බලපායි, මෙසේ පටිච්චසමුප්පන්න බව පරිසරයේ ආරක්ෂාවට මෙන් ම විනාසයට ද බලපායි. යන කරුණු පිළිතුරේ අන්තර්ගත විය යුතුය..

උපදෙස්

උපරිමය ලකුණු 07ක් සේ ගෙන ප්‍රමාණවත් පිළිතුරක්දැයි විමසා සුදුසු ලකුණක් ප්‍රදානය කරන්න.

5 ප්‍රශ්නය

(i) බ්‍රාහ්මණ සමාජයේ චතුර්වර්ණයට පැවරුණු කාර්ය නියමයන් නම් කරන්න. (ලකුණු 04යි)

පිළිතුර

බ්‍රාහ්මණ වර්ණය - *ඉගෙනීම, ඉගැන්වීම, යාගහෝම කිරීම, දන්දීම හා දන්පිළිගැනීම*

ක්ෂත්‍රිය වර්ණය - *ප්‍රජාරක්ෂණය, (රාජ්‍යපාලනය) යාගහෝම පැවැත්වීම අධ්‍යයනය*

වෛශ්‍ය වර්ණය - *පශුපාලනය කෘෂිකර්මය වෙළෙඳාම මුදල් ණයට දීම, අධ්‍යයනය යාග*

ශූද්‍ර වර්ණය - *සෙසු වර්ණ තුනට මෙහෙ කිරීම.*

Past Papers Wiki

උපදෙස්

එක් වර්ණයක කාර්ය නම්කිරීමට එක් ලකුණ බැගින් ලකුණු 04 ක් ප්‍රදානය කරන්න. .

(ii) ජන්මය ලැබූ සමාජ ස්ථරයේ ම පුද්ගලයා රඳවන බ්‍රාහ්මණ ඉගැන්වීම් සමාජ සචලතාවට බාධකයක් විය. යන කරුණ පැහැදිලි කරන්න. (ලකුණු 07යි)

පිළිතුර

නිදහස් පිළිතුරක් අපේක්ෂා කෙරේ.

උපදෙස්

ඉහත අදහස ප්‍රකට වන පිළිතුරකටලකුණු 07ක උපරිමයට යටත්ව සුදුසු ලකුණක් ප්‍රදානය කරන්න.

(iii) බලවත් පීඩාවක් හා අනර්ථයක්ව පැවති සමාජ සංස්ථාවක් වෙනස් කිරීමට බුදුරදුන් දැරූ ප්‍රයත්නය මානව වර්ගයාගේ ප්‍රණාමයට ලක් විය යුතුය,' යන ප්‍රකාශය විචාරයට කරන්න. (ලකුණු 07යි)

පිළිතුර

වර්ණභේදය, ස්ත්‍රීන් පහත් කොට සැලකීම, ආදී පීඩාකාරී හා අනර්ථකාරී තත්ත්වයන් නැතුවුරු කෙරුන සමාජ ක්‍රමයට වෙනස් කොට සමානාත්මතාව රජයන සමාජයක් නිර්මාණයට බුදු රදුන් කළ වෑයම විස්තර කර එය අගය කරන ආකාරයෙන් සැපයෙන නිදහස් පිළිතුරක් අපෙක්ෂිතයි.

උපදෙස්

සමස්තයක් ලෙස සලකා ඉහත දැක්වුණු කරුණු ප්‍රකටවන සේ සපයන සාරවත් පිළිතුරකට ලකුණු 07ක උපරිමයට යටත් ව සුදුසු ලකුණක් ප්‍රදානය කරන්න.

6 ප්‍රශ්නය

(i) එක්වන අඹුසැමි යුවලේ ස්වභාවය අනුව විවාහක යුගල හතරක් බුදුදහමේ දැක්වේ. එම යුගල හතර නම්කරන්න. (ලකුණු 04යි)

පිළිතුර

මළමිනියක් මළමිනියක් සමග විසීම

මළමිනියක් දෙවිදුවක හා විසීම

දේවපුත්‍රයෙකු දෙවි දුවක හා විසීම

දේවපුත්‍රයෙකු දෙවි දුවක හා විසීම

උපදෙස්

එක යුගලයක් නම් කිරීමට ලකුණු 01ක බැගින් ලකුණු 4ක් ප්‍රදානය කරන්න.

(ii) භාර්යාවන් හත් දෙනා නම්කර යෝග්‍ය අයෝග්‍ය යන කාණ්ඩ දෙකට වෙන් කර දක්වන්න. (ලකුණු 07යි)

පිළිතුර

අයෝග්‍ය

(i) *වධක සම*

(ii) *චෝරී සම*

යෝග්‍ය

PAST PAPERS WIKI

(iii) *අයපාඩිසම*

(iv) *මාතු සම*

(v) *භගිනි සම*

(vi) *සඛී සම*

(vii) *දාසි සම*

උපදෙස්

නම්කිරීමට ලකුණු 05ක් ද බෙදා දැක්වීමට ලකුණු 02ක් ද වශයෙන් ලකුණු 07ක් ප්‍රදානය කරන්න.

(iii) 'විවාහය යනු යුවලක් එක් වී කරන සදාචාර ප්‍රතිපත්ති පූරණයකි.' යන්න පැහැදිලි කරන්න.(ලකුණු 07යි)

පිළිතුර

ඉහත ප්‍රකාශය බුදු දහමේ ඇතැළත් වන කරුණු ඝුදුසු ලෙස දක්වමින් නහවුරු කරන නිදහස් පිළිතුරක් අපේක්ෂා කෙරේ.

උපදෙස්

ප්‍රමාණවත් කරුණු ඇතුළත් විචාරාත්මක තර්කානුකූල පිළිතුරකට උපරිමය ලකුණු 07ක් ලෙස සලකා සුදුසු ලකුණක් ප්‍රදානය කළ හැකිය.

7 ප්‍රශ්නය

(i) යුද්ධයට පසුබිම් වන මූලික චේතනා තුනක් නම්කරන්න. (ලකුණු 04යි)

පිළිතුර

තෘෂ්ණාව වෛරය හා පළිගැනීම.

උපදෙස්

ඉහත පිළිතුර ලියා තිබේ නම් ලකුණු 04ක් ප්‍රදානය කරන්න. කරුණු තුනම ඇත්නම් ලකුණු 4ක් ද දෙකක් ඇත්නම් ලකුණු 3ක් ද එකක් ඇත්නම් ලකුණු 2ක් ද වශයෙන් ප්‍රදානය කිරීම මැනවි.

(ii) 'ජයං වෙරං පසවති' යන ගාථාව සම්පූර්ණ කර ලියන්න. (ලකුණු 07යි)

පිළිතුර

ජයං වෙරං පසවති
දිනෝ විත්තමනුයොවති
උපසන්තෝ සුඛං සෙති
හිත්වා ජය පරාජයං

උපදෙස්

ගාථාව දැක්වීමට ලකුණු 04ක් ප්‍රදානය කරන්න. අක්ෂරවින්‍යාස දෝෂවලට ලකුණු අඩු නොකළ මැනවි.

(iii) යුද්ධයෙන් තොර සමාජයක් සඳහා බුදුදහමේ ඉගැන්වීම් සඳහන් කොටගෙන සාකසිය හැකි ප්‍රායෝගික වැඩ පිළිවෙළක් යෝජනා කරන්න. (ලකුණු 07යි)

පිළිතුර

බෞද්ධ දර්ශනය පදනම් කරගත්, ලෝකයේ යුද ගැටුම් නතර කළ හැකි අන්දම පැහැදිලි කරන ප්‍රයෝගික වැඩපිළිවෙළක් ඉදිරිපත් කැරෙන නිදහස් පිළිතුරක් අපේක්ෂා කෙරේ.

උපදෙස්

ප්‍රමාණවත් කරුණු සහිත විචාරාත්මක පිළිතුරකට ලකුණු 07ක උපරිමයට යටත් ව සුදුසු ලකුණක් ප්‍රදානය කළ හැකිය.

8 ප්‍රශ්නය

(i) තර්කයෙන් හෝ විද්‍යාවෙන් හසුකර ගත නොහැකි දෙයක් ලෙස බුදු දහමේ දැක්වෙන්නේ කුමක් ද?. (ලකුණු 04යි)

පිළිතුර

නිවන

උපදෙස්

ඉහත දැක්වුණු පිළිතුර ඇත්නම් ලකුණු 04ක් ප්‍රදානය කරන්න.

(ii) 'විද්‍යාව සමග බුදසමය බෙහෙවින් සමීප වන මූලික කරුණු හතරක් දක්වන්න. (ලකුණු 07යි)

පිළිතුර

(i) *අමූලික ශ්‍රද්ධාවෙන් පිළිනොගැනීම,*

(ii) *යොනිසොමනසිකාරයෙන් බැලීම*

(iii) *දැක දැන නහවුරු කරගැනීම*

(iv) *ප්‍රත්‍යක්ෂයෙන් විමර්ශනයෙන් දැකගැනීම*

(v) *පාරභෞතික සංකල්පවලින් බැහැරවීම.*

(vi) *හේතුඵලසම්බන්ධය පිළිගැනීම*

(vii) *ආත්මය ලෙස දැක්විය හැකි පදාර්ථයක් නැතැයි පිළිගැනීම*

ආදී කරුණු අතරින් හතරක්

උපදෙස්

කරුණු හතරක් දක්වා ඇත්නම් ලකුණු 07ක් ද තුනක් දක්වා ඇත්නම් ලකුණු 06ක් ද දෙකක් දක්වා ඇත්නම් ලකුණු 05ක් ද එකක් දක්වා ඇත්නම් ලකුණු 04ක් ද ප්‍රදානය කරන්න.

(iii) 'විද්‍යාඥයාට ගැලපෙන ආගම ලෙස විවිධ ආගම් අතරින් උපුටා දැක්විය හැක්කේ බුදුදහමයි,' යන්නට පක්ෂව හෝ විපක්ෂව හෝ කරුණු දක්වන්න. (ලකුණු 07යි)

පිළිතුර

නිදහස් පිළිතුරක් අපේක්ෂිතයි. බෞද්ධසමාජදර්ශනය පාඨ ග්‍රන්ථයේ 82,83,84,85 පිටුවල අන්තර්ගත කරුණු අදාළ කර ගත හැකිය.)

උපදෙස්

ප්‍රමාණවත් පිළිතුරකට සුදුසු ලකුණු 07ක උපරිමයට යටත්ව සුදුසු ලකුණක් ප්‍රදානය කරන්න.



ශ්‍රී ලංකා
විභාග දෙපාර්තමේන්තුව



ලකුණු දීමේ පටිපාටිය

බෞද්ධ ධර්මාචාර්ය විභාගය 2017 (2018)

(05) බෞද්ධ සමාජ දර්ශනය.

ඇගයීම් (ආයතනික විභාග) ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත, බත්තරමුල්ල.

මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි. ප්‍රධාන පරීක්ෂක සාකච්ඡා පැවැත්වෙන අවස්ථාවේ දී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

උත්තර පත්‍ර පරීක්ෂකවරුන්ගේ
ප්‍රයෝජනය සඳහා පමණි.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

2562 - බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2017 (2018)

S 5

(05) බෞද්ධ සමාජදර්ශනය

පැ තුනයි

I කොටසේ ප්‍රශ්නය ද, II වන කොටසින් තෝරාගත් තවත් ප්‍රශ්න හතරක් ද ඇතුළු ව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

සැ.යු. I කොටසේ ප්‍රශ්නයට පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම ලියා, II කොටසේ පිළිතුරු පත්‍රය සමඟ අමුණා භාරදෙන්න.

විභාග අංකය : .....

I කොටස

1. (i) සමාජවිද්‍යා විෂය හා සමාජදර්ශනය අතර පවත්නා වෙනස කුමක් ද? *(ලකුණු 01 යි)*

.....

.....

(ii) බුදුරජාණන් වහන්සේ දෙමව්පියන් හැඳින්වීමට භාවිත කළ ගෞරවනීය වචන (අධිවචන) තුනක් ලියා, ඒවායෙහි අදහස් පෙන්වා දෙන්න. *(ලකුණු 03 යි)*

(අ) .....

(ආ) .....

(ඉ) .....

(iii) "ඇසුරට සුදුසු යැයි තමන් විසින් තෝරා ගන්නා යහපත් (කල්‍යාණ) මිත්‍රයන්ට සංග්‍රහ කළ යුතු ආකාරය බුදුරජාණන් වහන්සේ පෙන්වා දුන් සේක." එම කරුණු අතුරින් තුනක් ගෙනහැර දක්වන්න. *(ලකුණු 03 යි)*

(අ) .....

(ආ) .....

(ඉ) .....

(iv) "අග්ගඤ්ඤ සූත්‍ර විවරණයට අනුව සමාජයෙහි නුදුන් දේ ගැනීම් ආදී අසද්ධර්ම පහළ වූ බැවින්, හෙළා දැකිය යුත්තන් හෙළා දකින්නට, ගැරහිය යුත්තන් ගරහන්නට, පිටුවහල් කළ යුත්තන් පිටුවහල් කරන්නට සමත් අභිරූපී, දර්ශනීයතර, සිත් පහදවනසුලු මහේශාක්‍ය පෙනුමැති පුද්ගලයකු ඔවුහු තෝරා ගත්හ'යි පැවසේ." එම තැනැත්තා හැඳින්වීමට භාවිත කළ යෙදුම් තුනක් ඊට අදාළ අර්ථ සමඟ දක්වන්න. *(ලකුණු 03 යි)*

(අ) .....

(ආ) .....

(ඉ) .....

(v) 'ප්‍රාණඝාත විරමණ ශික්ෂාව පරිපූර්ණ වීම සඳහා විරති හා සමාදාන යන දෙඅංශය ම සම්පූර්ණ විය යුතු වේ.' ඒ අනුව, 'පාණාතිපාතං පහාය පාණාතිපාතා පටිවිරතො හොති නිහිතදණ්ඩො, නිහිතසත්ථො, ලජ්ජී, දයාපන්නො, සබ්බපාණභූතහිතානුකම්පී විහරති' යන්නෙහි විරති පක්ෂයට හා සමාදාන පක්ෂයට අයත් අංග තුන බැගින් වෙන්කොට දක්වන්න. *(ලකුණු 03 යි)*

විරති :

(අ) .....

(ආ) .....

(ඉ) .....

WIKI

[2 වැනි පිටුව බලන්න.

සමාදාන :

(අ) .....

(ආ) .....

(ඉ) .....

(vi) සමාජ ශෝධකයකු ලෙස බුදුරජාණන් වහන්සේ චතුර්වර්ණ ඉගැන්වීම නිර්දය ලෙස ප්‍රතික්ෂේප කරමින් දේශනා කළ සූත්‍ර ධර්ම තුනක් නම් කර, ඒවාට අයත් ඉගැන්වීම් තුනක් ගෙනහැර දක්වන්න. *(ලකුණු 03 යි)*

(අ) .....

(ආ) .....

(ඉ) .....

(vii) "ජීවිත රැක දීම සඳහා කැපවීම තුළින් ලබන පරාජය ද ජයග්‍රහණයකි." මෙම ආකල්පය බෞද්ධ ඉතිහාසයේ නිරූපණය වූ අයුරු අගය කරමින් ජෝන් වෝල්ටර්ස් නම් ලේඛකයා විසින් 'නොසැලෙන මනස' නම් ග්‍රන්ථයේ දැක්වූ කරුණු තුනක් ඉදිරිපත් කරන්න. *(ලකුණු 03 යි)*

(අ) .....

(ආ) .....

(ඉ) .....

(viii) බුද්ධකාලීන භාරතයේ සොළොස්මහා ජනපද අතුරින් රාජාණ්ඩු පාලනය පැවති ජනපද තුනක් නම් කර, ඒවායෙහි රාජ්‍ය පාලනයේ මූලික ලක්ෂණ එක බැගින් සඳහන් කරන්න. *(ලකුණු 03 යි)*

(අ) .....

(ආ) .....

(ඉ) .....

(ix) කූටදන්ත සූත්‍රය නිර්දේශ කරන, වෙළෙඳාම හැර වෙනත් දැහැමි ජීවන වෘත්තීන් තුනක් නම්කොට, පඤ්චවිධ වෙළෙඳාමෙන් වෙන්වීම මූලික මානව හිමිකම් උල්ලංඝණය නොවන්නාක් බවට හේතු තුනක් දක්වන්න. *(ලකුණු 03 යි)*

(අ) .....

(ආ) .....

(ඉ) .....

(x) "භූතන ආර්ථික චින්තනය නිෂ්පාදනය, පරිභෝජනය, බෙදාහැරීම වැනි කරුණු පිළිබඳව සාකච්ඡා කරන ආකාරයෙන් බුදුදහම ඒ ගැන දේශනා නොකළත්, ඊට සාපේක්ෂ ආර්ථික චින්තනයක් ඉදිරිපත් කරයි." බුදුසමය නිර්දේශ කරන ආර්ථික චින්තනයේ මූලික සංකල්ප තුනක් ඊට අදාළ නිදර්ශන තුනක් සමඟ දක්වන්න. *(ලකුණු 03 යි)*

(අ) .....

(ආ) .....

(ඉ) .....

**

සියලු ම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

2562 - බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2017 (2018) **S 5**

(05) බෞද්ධ සමාජදර්ශනය

ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

II කොටස

2. (i) සමාජ දර්ශන විෂය ක්ෂේත්‍රය සඳහා අනුග්‍රහය දක්වන විෂය හතරක් නම් කරන්න. *(ලකුණු 04 යි)*

(ii) දැඩි ශාස්ත්‍රීය බව රැක ගැනීම පිණිස වාස්තවිකව සිදු කරන විද්‍යාත්මක අධ්‍යයනවල දී මගහැරී යන සදාචාර නිර්ණායක හතරක් පෙන්වා දෙන්න. *(ලකුණු 07 යි)*

(iii) "බුදුසමය හුදු ආගමික සිද්ධාන්ත සමූදායකට වඩා සමාජ දර්ශනයකි." විෂය ක්ෂේත්‍ර හතරකට අයත් බෞද්ධ ඉගැන්වීම් ඇසුරින් ඉහත ප්‍රකාශය තහවුරු කරන්න. *(ලකුණු 07 යි)*

3. (i) බුදුසමයේ සමාජ දර්ශනය පිළිබඳ සංකල්පය ප්‍රකට කෙරෙන සූත්‍ර දේශනා හතරක් නම් කරන්න. *(ලකුණු 04 යි)*

(ii) සදිසා නමස්කාර සමාජ සංකල්පයෙහි සදිසා නම් කර, ඊට අදාළ පුද්ගල ප්‍රභේද කවරේ දැයි කෙටියෙන් හඳුන්වන්න. *(ලකුණු 07 යි)*

(iii) නූතන පවුල් සංස්ථාවෙහි අඹු-සැමියන් අතර පැනනැඟී ඇති ගෘහස්ථ අර්බුද අවම කර ගැනීමෙහිලා සිගාලෝවාද සූත්‍රයේ ස්වාමි-භාර්යා යුතුකම් හා වගකීම් කෙතෙක් දුරට අදාළ වේ දැයි විමසන්න. *(ලකුණු 07 යි)*

4. (i) සමාජ සංස්ථාවල ප්‍රභවය හා පරිණාමය පිළිබඳ අග්ගඤ්ඤ සූත්‍රය ඉදිරිපත් කරන කරුණු අතුරින් හතරක් ගෙනහැර දක්වන්න. *(ලකුණු 04 යි)*

(ii) අග්ගඤ්ඤ සූත්‍රයෙහි ලෝක විභාගයට අදාළ ඉගැන්වීමෙහි සංවර්තමාන හා විවර්තමාන කෙටියෙන් පැහැදිලි කරන්න. *(ලකුණු 07 යි)*

(iii) "නූතන සමාජය තුළ ගැටුම් හා විෂමතා පැනනැඟීමට ප්‍රධාන සාධකය වී ඇත්තේ ආර්ථිකයයි." සමතුලිත සාධාරණ සමාජයක් උදෙසා ආර්ථිකය විෂයෙහි දේපළ අයිතිය, බදු ක්‍රමය, රාජ්‍ය පාලනය හා අධිකරණය යන සංස්ථාවල කාර්යභාරය කවරේ දැයි අග්ගඤ්ඤ සූත්‍ර විවරණය ඇසුරින් සාකච්ඡා කරන්න. *(ලකුණු 07 යි)*

5. (i) මිනිසා හා බැඳී පවත්නා, විශ්ව සාධාරණ ලෙස බලපාන නියාම ධර්ම අතුරින් හතරක් නම් කරන්න. *(ලකුණු 04 යි)*

(ii) බුදුසමයෙහි ඉගැන්වෙන සංසාර සංකල්පය ජීව-අජීව පරිසරය කෙරෙහි බලපාන අයුරු කෙටියෙන් පැහැදිලි කරන්න. *(ලකුණු 07 යි)*

(iii) නූතනයෙහි ඒකාංශිකව අවධානය යොමු කොට ඇති මානව හිතවාදයකට හෝ සත්ත්ව හිතවාදයකට හෝ වඩා බුදුසමය පරිසරය කෙරෙහි ජීව හිතවාදී ආකල්පයක් දක්වන්නේ දැයි බෞද්ධ ඉගැන්වීම් ඇසුරින් සාකච්ඡා කරන්න. *(ලකුණු 07 යි)*

6. (i) බුද්ධකාලීන භාරතීය සංකීර්ණ ආගමික පරිසරය නියෝජනය කළ ශ්‍රමණ කණ්ඩායම් හතරක් නම් කරන්න. *(ලකුණු 04 යි)*

(ii) එම ශ්‍රමණ කණ්ඩායම් අතර එකිනෙකා නුරුස්සමින්, විචිත්‍ර දෘෂ්ටිවාද මතුකරමින් ඉදිරිපත් කළ ආගමික ඉගැන්වීම් හතරක් කෙටියෙන් දක්වන්න. *(ලකුණු 07 යි)*

(iii) වර්තමාන ශ්‍රී ලාංකික සමාජයේ විවිධ ආගමික පිරිස් අතර දෘෂ්ටිවාද හා විවිධ ක්‍රියාකාරකම් නිසා වරින්වර පැනනගින නොසන්සුන්තා සමනයට බුදුරදුන්ගේ ආගමික සහනශීලී ප්‍රතිපත්තිය උපයෝගි කරගත හැකි ආකාරය ඉදිරිපත් කරන්න. *(ලකුණු 07 යි)*

7. (i) ජනගහන වර්ධනය නිසා රටක සංවර්ධනයට සෘජුව බලපෑම් ඇති කළ හැකි ගැටලු හතරක් දක්වන්න. *(ලකුණු 04 යි)*

(ii) ජනගහන පාලනයෙහිලා අනුගමනය කෙරෙන ක්‍රියාමාර්ග කෙටියෙන් පැහැදිලි කරන්න. *(ලකුණු 07 යි)*

(iii) ජනගහන පාලනයෙහිලා නූතනයෙහි යම් ප්‍රවණතාවක් වී ඇති ගර්භනාශය හෙවත් ගබ්සාව විෂයයෙහි බුදුසමයේ ආකල්පය දක්වා, එහි ලා ඉදිරිපත් කළ හැකි නිර්දේශ සාකච්ඡා කරන්න. *(ලකුණු 07 යි)*

8. (i) ගෘහස්ථයා ආර්ථික සත්ත්වයකු වශයෙන් හැඳින ගන්නා, බුදුසමය නිර්දේශ කරන, ආර්ථිකය සමග බැඳුණු චතුර්විධ සුබ ලියා දක්වන්න. *(ලකුණු 04 යි)*

(ii) "මිනිසා ධනය රැස්කළ යුත්තේ තමා පමණක් සැපවත් වීම (ස්වාර්ථය)ට පමණක් නොව පරාර්ථය පිණිස ද යෙදවීමට ය." බුදුසමයේ ධනය පිළිබඳ ආයතන පරිභෝජන සංකල්පය ඇසුරින් ඉහත ප්‍රකාශය කහවුරු කරන්න. *(ලකුණු 07 යි)*

(iii) කෙසේ හෝ ධනය උපයා ගැනීමෙන් ආර්ථික සමෘද්ධිය සලසා ගැනීම නූතන සමාජ ප්‍රවණතාව, බුදුසමයේ ආර්ථික දර්ශනයට එකඟ වන්නේ දැයි එහි සදාචාර නිර්ණායක ඇසුරින් විමසන්න. *(ලකුණු 07 යි)*

* * *

බෞද්ධ ධර්මාචාර්ය විභාගය 2017 (2018)

(05) බෞද්ධ සමාජ දර්ශනය.

(05) බෞද්ධ සමාජ දර්ශනය.ලකුණු දීමේ පටිපාටිය

I කොටස සඳහා ලකුණු	-	28
II කොටස සඳහා ලකුණු	-	72 (18×4)
ලකුණු එකතුව	-	100

I කොටසේ

I ප්‍රශ්නය සඳහා ලකුණු	01 යි.
II සිට X ප්‍රශ්නය සඳහා ලකුණු 3 බැගින්	27 යි
	28 යි.

II කොටසේ ප්‍රශ්න අතුරින් තෝරාගත් ප්‍රශ්න 04 කට පිළිතුරු සැපයීම අවශ්‍යය. සෑම ප්‍රශ්නයක් ම කොටස් 03 කින් යුක්ත වේ.

i කොටසට ලකුණු 04 බැගින් ද,

ii කොටසට ලකුණු 07 බැගින් ද,

iii කොටසට ලකුණු 07 බැගින් ද, හිමි වේ.

මේ අනුව එක් ප්‍රශ්නයකට ලකුණු 18 බැගින් ප්‍රශ්න 04 ට **ලකුණු 72ක්** හිමි වේ.

I කොටස

01.

i. සමාජ විද්‍යා විෂය තුළ විද්‍යාත්මක ඥානයෙන්, වාස්තවිකව නිගමන ලබාදෙන අතර සමාජ දර්ශනය විෂයයෙන්, එම දත්තයන් පිළිබඳවම පොදු හා පුළුල් ආකල්පයකින් සමස්ත සමාජයට හා පුද්ගලයාට බලපාන අර්ථවත් වන ආකාරයෙන් ඇගයුම්ශීලිව විග්‍රහ කිරීම සිදු කරයි. වෙනස එයයි.

(ලකුණු 01යි.)

ii. (1) බ්‍රහ්ම - සතර බ්‍රහ්ම විහරණයෙන් කටයුතු කරන බැවිනි.

(2) පුබ්බාචරිය - මුල් ගුරුවරුන් වන බැවිනි.

(3) පුබ්බදේව - පළමුව පිදිය යුතු බැවිනි.

(4) ආහුණෙය්‍ය - දුර බැහැර සිට පැමිණ ඇප උපස්ථාන කිරීමට සුදුසු බැවිනි.

(5) පජාය අනුකම්පක - ප්‍රජාවට අනුකම්පා කරන බැවිනි.

(ලකුණු 03යි.)

iii. (1) පරිත්‍යාග කිරීමෙන්

(2) ප්‍රිය වචනයෙන්

(3) දියුණුවට අනුබල දීමෙන්

(4) සමානත්වයෙන් සලකා ක්‍රියාකිරීමෙන්

(5) අවංක බවින් කටයුතු කිරීමෙන්

(ලකුණු 03යි.)

iv. (1) මහා සම්මත - මහජනතාවගේ කැමැත්තෙන් පත්වන බැවිනි.

(2) බත්තිය - කෙත්වතු වලට අධිපතිව ඒවායේ නිසි පරිහරණය සහතික කරන බැවිනි.

(3) රාජා - ධර්මයෙන් අනුන්ගේ (ජනතාවගේ) සිත් සතුටු කරවන (රංජනය) බැවිනි.

(ලකුණු 03යි.)

v. **විරති පක්ෂය**

(1) පාණාතිපාතං පහාය - ප්‍රාණඝාතයෙන් වැළකීම.

(2) නිහිත දණ්ඩෝ - බැහැර කරන ලද දඬු මුගුරු ඇත්තේ

(3) නිහිත සත්ථෝ - බැහැර කරන ලද අවි - ආයුධ ඇත්තේ

සමාදාන පක්ෂය

ලජ්ජි	- පාපයට ලැජ්ජා ඇත්තේ
දයාපන්නෝ	- දයාවෙන් යුක්ත වූයේ
හිතානුකම්පි විහරති	- සියළු සතුන් කෙරෙහි හිතානුකම්පා (මෛත්‍රීය) ඇත්තේ වාසය කරයි.

(ලකුණු 03යි.)

vi. **(1) එසුකාරී සූත්‍රය** - වර්ණ භේදය මිනිසුන්ගේ මූලික අයිතිවාසිකම් වලට පටහැනි වූ ප්‍රජාතන්ත්‍රවාදී නොවූ ඒකා පාර්ශ්වික බෙදීමක් බව පෙන්වා දෙයි.

(2) අස්සලායන සූත්‍රය - වර්ණ භේදය යුක්ති යුක්ත කිරීම පිණිස බමුණන් විසින් ඉදිරිපත් කරන ඥාන විභාගමය පදනම වූ වෛදික ශ්‍රැතියෙහි අන්තර්ගත වූ තමන්වෙත පරපුරෙන් පරපුරට උරුම වූ ආගමික පිළිගැනීමක් බව කියා පාමිනි. එහෙත් බ්‍රාහ්මණයන්ගේ උත්පත්ති ක්‍රමයද සාමාන්‍ය වෙනත් පුද්ගලයන්ගේ උප්පත්ති ක්‍රමයම බව, බැමිණියන් වැඩිවිය පැමිණෙන බව, ගැබ්බර වන බව, දරුවන් බිහිකරන බව, දරුවන්ට කිරිදෙන බව ආදියෙන් සනාථ වේ. ඊට වඩා වෙනස් ක්‍රමයකින් බ්‍රාහ්මණයන් පහළ වූවා විය නොහැකිය යනුයි.

(3) වාසෙට්ඨ සූත්‍රය - ගස් වැල් වෙන්කොට හඳුනා ගන්නේ ඒ ඒ ශාක වර්ගවලට උරුම වූ ජාති ලක්ෂණ ඇති නිසා බවත් මනුෂ්‍ය වර්ගයා අතර එබඳු ජීව විද්‍යාත්මක වර්ග කිරීමක් නොපෙනෙන බවත්, සමස්ත මනුෂ්‍ය වර්ගයාම එක් ජීව විද්‍යාත්මක කොට්ඨාසයක් බවත් පෙන්වා දීම.

(4) අග්ගඤ්ඤ සූත්‍රය - ඓතිහාසික, සමාජ, මානව විද්‍යාත්මක ස්වරූපය අනුව චතුර් වර්ණය ප්‍රතික්ෂේප කොට තිබේ. සමාජ ආර්ථික ක්‍රියාවලියක් මත වර්ණ සම්මුතිය ඇති වූ බව එහි ඉගැන්වේ.

(ලකුණු 03යි.)

vii.

1. බෞද්ධයෝ තම ආගම වෙනුවෙන් කිසි විටක යුද්ධ නොකිරීම.
2. මිථ්‍යාදෘෂ්ටි නැති කිරීම සඳහා අන්‍ය ලබ්ධිකයන්ටම වධ බන්ධන කිරීම හෝ බලයෙන් තම ආගමට බඳවා ගැනීම හෝ කිසි විටක සිදු නොකිරීම.
3. නිතර අන් අදහස් ඉවසන සුළු වීම.
4. නියම බෞද්ධයාට සතුරන්ගේත් මිතුරන්ගේත් ජීවිත එකක් වීම.

5. සෑම දරුණු ක්‍රියාවකින්ම වැළකී සිටිය යුතු බව.
6. හොඳම පළිගැනීමේ මාර්ගය නම් කරුණාවන්ත සිතිවිලි ඇතිකර ගැනීම කුළුග් බව ආදියයි.

(ලකුණු 03යි.)

viii. රාජාණ්ඩු හතර නම්,

මගධ රාජ්‍යය, කෝසල රාජ්‍යය, වත්ස රාජ්‍යය, අවන්ති රාජ්‍යය යනුයි.

ඒවායෙහි රාජ්‍ය පාලනයේ මූලික ලක්ෂණ

1. පියපුතු පරපුරට බලය උරුම වීම හා බලය ලබා ගන්නා රජුගේ ආඥාව යටතේ රට පාලනය වීම.
2. එම පාලනය වෙනස් වූයේ බලයේ සිටින රජු ඝාතනය වීමෙන් පසු වෙනත් රජෙකු විසින් බලය අල්ලා ගැනීමෙන් බව.
3. විධායක ව්‍යවස්ථාදායක හා අධිකරණ යන ආයතන තුනෙහිම බලය රජු කේන්ද්‍ර කොට පැවතීම.
4. මන්ත්‍රී පර්ෂද නම් උපදේශක සභාවක් පැවතීම.
5. පුරෝහිතයෙකුගේ උපදෙස් ලැබීම.
6. රාජාඥාව ඉතා ප්‍රබල වූ අතර එය උල්ලංඝනය කිරීම දඬුවම් ලැබීමට පවා හේතු වීම ආදියයි.

(ලකුණු 03යි.)

ix. දැහැමි ජීවන වෘත්තීන් ලෙස,

1. කෘෂිකර්මාන්තය (කසී)
2. පශු රක්ෂණය (ගොරක්ඛ)
3. කර්මාන්තවල යෙදීම (සිප්පඤ්ඤතර)
4. රාජ්‍ය සේවය (රාජපොරිස)
5. හමුදා සේවය (ඉස්සත්ථ) ආදියයි.

මානව හිමිකම් උල්ලංඝනය වීමක් නොවීමට,

1. පඤ්චවිධ වෙළඳාම් පහෙන්ම සිදුවන්නේ සාර්ථක ජීවිත ගත කරන්නට බලාපොරොත්තු වන පිරිසකගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීම.
2. ජීව - අජීව පරිසරයට හානි වීම.
3. එම වෘත්තීන්හි නියුතු පුද්ගලයන්ගේ මනස පවා අධර්මයට හුරුපුරුදු වීම.
4. ඔවුන්ගේ මනස ආර්ය මාර්ගයට යොමු නොවීම ආදියයි.

(ලකුණු 03යි.)

Past Papers Wiki

x.

1. **ධනෝපාර්ජනය** - ධනය ඉපයීම - දැහැමින් සෙමින්, දහඩිය මුගුරු වගුරවමින්, දෑතේ වෙර වීර්යයෙන් ධනය ඉපයිය යුතු බව.
2. **ධනපරිභෝජනය** - ධනය පරිභෝජනය කළ යුත්තේ, තමාටත්, අනුන්ටත්, ධනය බෙදාහදාගෙන, තමා සැපවත් වීම හා අනුන් ද සැපවත් කරවීම යන ක්‍රමයට වීම.
3. **ධන සංරක්ෂණය** - ධනය ආරක්ෂා කළ යුත්තේ භෝග අපාය මුඛ වලින් වැළකී ක්‍රියාකිරීමෙනි.
4. **ධන සංවිභජනය හෙවත් ධන කළමණාකරණය** - ධනය කොටස් හතරකට බෙදා එක් කොටසක් පරිභෝජනයටත්, කොටස් දෙකක් ආයෝජනයටත්, ඉතිරි කොටස ආපදාවකදී ගැනීමට තැන්පත් කිරීමටත් හැකි පරිදි කළමණාකරණය කළ යුතුවේ..

(ලකුණු 03යි.)

II කොටස

02.

i. මානව විද්‍යාව, සංස්කෘතික මානව විද්‍යාව, සමාජ මනෝ විද්‍යාව, මානව වංශ විද්‍යාව, නීතිය, ආර්ථික විද්‍යාව, භූගෝල විද්‍යාව, සමාජ විද්‍යාව , ඓතිහාසික විද්‍යාව ;

(ලකුණු 04යි.)

ii. හොඳ - නරක පිළිබඳ විනිශ්චය, යුතුකම් - අයුතුකම් පිළිබඳ විනිශ්චය, පින් - පව් පිළිබඳ විනිශ්චය, ධර්මය - අධර්මය පිළිබඳ විනිශ්චය, ගුණ - අගුණ පිළිබඳ විනිශ්චය, සාර - අසාර විනිශ්චය, සදාචාර - දුරාචාර විනිශ්චය, හැඟීම් බර - හැඟීම් රහිත බව විනිශ්චය ආදියයි.

(ලකුණු 07යි.)

iii.

1. බෞද්ධ සමාජ දර්ශනය - පුද්ගලයා හා සමාජය, යුතුකම් හා වගකීම් සදිසා නමස්කාරය ආදිය සිඟාලෝවාද සූත්‍රය ඇසුරෙන්,
2. සමාජ සංස්ථාවන්ගේ ප්‍රභවය හා පරිණාමය - චතුර්වර්ණය, ආදිය අග්ගඤ්ඤ සූත්‍රය ඇසුරෙන්,
3. ජීව - අජීව පරිසරය - මානව හිතවාදය, සත්ව හිතවාදය, ජීව හිතවාදය ආදිය ථෙර - ථෙරී ගාථා, සංයුත්ත නිකායේ වනරෝප සූත්‍රය, කරණීයමෙත්ත සූත්‍රය ආදිය ඇසුරෙන්,

4. බුදුසමයේ දේශපාලන චින්තනය - රාජාණ්ඩු ක්‍රමය, සමූහාණ්ඩු ක්‍රමය සප්ත අපරිහාණීය ධර්ම, සතර සංග්‍රහ වස්තු, දස සක්විතිවත්, දස රාජධර්ම, පඤ්චශීල ප්‍රතිපදාව ආදිය චක්කවත්තිසීහනාද සූත්‍රය, අග්ගඤ්ඤ සූත්‍රය, මහා පරිනිබ්බාන සූත්‍රය ආදියෙන්,
5. බුදු සමයේ ආර්ථික චින්තනය - ධනය ඉපයීම, ධන පරිභොජනය, ධන සංරක්ෂණය. සදාචාර ධර්ම ආදිය ව්‍යග්ඝපජ්ජ සූත්‍රය, පත්තකම්ම සූත්‍රය, අණන සූත්‍රය, රාසිය සූත්‍රය, වඩ්ඩී සූත්‍රය, සිඟාලෝවාද සූත්‍රය ආදිය ඇසුරෙන්.
6. නීතිය යුක්තිය හා දණ්ඩනය පිළිබඳ ඉගැන්වීම්
7. යුද්ධය හා සාමය පිළිබඳ ඉගන්වීම්
8. සාමාජික සහජීවනය
9. විද්‍යාව, තාක්ෂණය හා කාර්මිකකරණය ආදි ක්ෂේත්‍ර

(ලකුණු 07යි.)

(මුළු ලකුණු 18යි.)

03.

i. සිඟාලෝවාද සූත්‍රය, අග්ගඤ්ඤ සූත්‍රය, චක්කවත්ති සිහනාද සූත්‍රය, වසල සූත්‍රය. පරාභව සූත්‍රය, මංගල සූත්‍රය, කරණීයමෙත්ත සූත්‍රය, ව්‍යග්ඝපජ්ජ සූත්‍රය, ද්විචක්බු සූත්‍රය, රාසිය සූත්‍රය, වනරෝප සූත්‍රය ආදිය

(ලකුණු 04යි.)

ii.

මාතා පිතා දිසා පුබ්බා	- නැගෙනහිර	- මව්පියන්
ආචරියා දක්ඛිණා දිසා	- දකුණ	- ගුරුවරු
පුත්තදාරා දිසා පච්චා	- බටහිර	- අඹු - දරුවන්
මිත්තා-මච්චාච උත්තරා	- උතුර	- මිත්‍ර - අමාත්‍ය
දාස කම්මකරා හෙට්ඨා	- යට	- දැසි දස් කම්කරු - සේවකයෝ
උද්ධං සමණ බ්‍රාහ්මණා	- උඩ	- ශ්‍රමණ - බ්‍රාහ්මණවරු - පැවිද්දෝ

(ලකුණු 07යි.)

iii.

භාර්යාවට	ස්වාමියාට
1. ගෞරවාන්විතව ක්‍රියාකිරීමෙන්	නිවසේ යුතුකම් මැනවින් සැලසුම් කිරීමෙන්.
2. අගෞරව නොකිරීමෙන්	පිරිවර ජනයාට නිසිලෙස සංග්‍රහ කිරීමෙන්
3. දුසිරිතෙහි නොයෙදීම	දුසිරිතෙහි නොයෙදීමෙන්
4. ඉසුරු පවරා දීමෙන්	මිල මුදල් ආදිය විනාශ නොකිරීමෙන්
5. ආභරණ ආදිය ගෙන දීමෙන්	දක්ෂව අලස නොවී සියළු කටයුතු කිරීමෙන්

(ලකුණු 07යි.)

(මුළු ලකුණු 18යි.)

04.

i.

1. අහෝ රසං අහෝ රසං (අනේ රසයි අනේ රසයි.)
2. අහු වත නෝ, අහාසි වත නෝ (අපිට හිඹුණා, නැති වුණා)
3. වඩූය, නිබ්බුය්ස්හමානාය, පසුංඛිපති ලෙඛ්බු ඛිපති, ගොමයං ඛිපන්ති (මනාලියක කැඳවාගෙන යනවිට පස්. ගල් කැට, ගොම ආදිය දමා ගැසීම)
4. මහාසම්මත, ඛත්තිය, රාජා යන රාජ සංස්ථාව
5. බ්‍රාහ්මණ, ඣායක, අජ්ඣායක (අධ්‍යාපන සංස්ථාව ආගමික සංස්ථාව)
6. වෙස්ස (සිටුවර සංස්ථාව - වෙළඳ ප්‍රජාව)
7. සුද්දා (මෙහෙවර කරන්නන්, සේවක ප්‍රජාව ආදිය)

(ලකුණු 04යි.)

ii. සංවට්ටමාන යනු හැකිලීමයි. විවට්ටමාන යනු විකාශනයයි. මෙහි ලෝකය නම් විශ්වයයි. එම ඉගැන්වීමට අනුව විශ්වය චූලනිකා ලෝක ධාතු, මජ්ජිමකා ලෝකධාතු හා මහා ලෝක ධාතු යනුවෙන් තුනකට බෙදේ. මෙයින් කුඩාම වන්නේ චූලනිකා ලෝක ධාතුයි. එබඳු චූලනිකා ලෝක ධාතු රැසකින් මජ්ඣිමකා ලෝක ධාතුවක්ද එවැනි රැසකින් මහා ලෝක ධාතුවක් ද සෑදෙයි.

එම ලෝක ධාතූන් සංවට්ටමාන යුගයෙහි සත්ව ජීවිතය අපහසුය. සත්වයෝ ආභස්සර කායිකව සූක්ෂ්ම ස්වරූපයෙන් ජීවත් වෙති. ලෝකයෙහි විවට්ටමාන යුගයෙහි ආභස්සර කායික සත්වයෝ ඉන් චුතව පෘථිවියට එති. පෘථිවිය විකම ජල ගෝලයක් මෙන් අඳුරෙහි දිගු කලක් පවතී. මෙහි වාසයට එන සත්වයෝ ආකාසචාරී, සයං සභාව, ජීති හක්ඛාව හැසිරෙති. කල්යාමේදී ජලගෝලය රස පෘථිවිය වේ. එතැන් සිට රස තෘෂ්ණාව හේතු කොටගෙන ලෝකයේ වෙනස් වීමත්, සත්ත්වයාගේ ස්වරූපයත් වෙනස් වේ. මෙසේ ලෝකයේ විකාශනය විවට්ටමාන යැයි කියනු ලැබේ.

(ලකුණු 07යි.)

iii.

- ලෝල ජාතික සත්ත්වයා නිසා රස තෘෂ්ණාව ඇති වීම.
- රස පෘථිවිය පහළ වීම හා එය අතුරු දහන් වීම.
- භූමි පප්පටක පහළවීම හා එය අතුරුදහන් වීම.
- බදාලතා පහළ වීම හා එය අතුරුදහන් වීම.
- ස්වංජාත හැල් පහළ වීම හා එය අතුරුදහන් වීම.
- සන්නිධිකාර පරිභෝජනයට යොමු වීම.
- වී පහළ වීම හා ඒවා වගාකොට ජීවත් වීම.
- සිය භූමි කොටස වැට කඩොලු ආදියෙන් වෙන්කර ගැනීම හා අන්‍යයන්ගේ කොටස් එක්කර ගැනීම.
- මේ නිසා ඔවුනොවුන් අතර අර්බුද - රන්ධූ කෝළාහල ඇති වීම.
- රජ කෙනෙකුගේ අවශ්‍යතාව පැන නැගීම.
- රජු පත්කර ගැනීම හා රජුට අයබදු ලබා දීම.

ආදී කරුණු ඇසුරිනි.

(ලකුණු 07යි.)

(මුළු ලකුණු 18යි.)

05.

i. උතු නියාමය, බීජ නියාමය, ධම්ම නියාමය, කම්ම නියාමය, හා චිත්ත නියාමය යනුයි.

(ලකුණු 04යි.)

ii.

